# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 13,206 — 1962 ජූලි 13 වැනි සිකුරාද — 1962.7.13

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිඬ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡේදය – සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි, සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොද ඇත.)


| | පිට | | පිට |
|---|---|---|---|
| අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන ප්‍රකාශන ආදිය ... ... | — | ආණ්ඩුවේ නිවේදන ... ... ... | 1042 |
| අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත් කිරීම් ආදිය ... | 1039 | මිළ පාලන දැන්වීම් ... ... ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් ආදිය ... | — | ශ්‍රී ලඞ්කා මහා බැංකුවේ දැන්වීම් ... ... | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරන පත්කිරීම් ආදිය ... | 1040 | ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... | — |
| වෙනත් පත් කිරීම් ආදිය ... ... ... | 1041 | ආණ්ඩුවේ වත් කම් හා බැරකම් ප්‍රකාශ ... ... | — |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත් කිරීම් ආදිය ... ... | — | විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... | 1045 |
| | | "සුරාබදු ආඥාපනත" පිළිබඳ දැන්වීම් ... ... | — |


[සැ. යු.—මේ වර ප්‍රසිද්ධ කරනු ලබන ගැසට් පත්‍රයේ VI වැනි කොටසේ ජූරි සභිකයන්ගේ සහ උපදේශකවරුන්ගේ නාමලේඛනය පළවේ.]

## අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත්කිරීම් ආදිය

1962 අංක 272

අංකය : ඩී/වීඑෆ්ජ්/40.

### යුද්ධ හමුදව—ලංකා ස්වේච්ඡා බල සේනාව—අග්‍රාණ්ඩුකාරතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද උසස් කිරීමක් හා මාරුකිරීමක්

#### උසස් කිරීම

1960 ඔක්තෝබර් මස 1 දින සිට මේජර් වශයෙන් :—

කපිතාන් (තාවකාලික මේජර්) ස්ටැන්ලි ලෙනාඩ් වැගොඩපොල, සි. රෙ.

#### මාරුකිරීම

ලංකා යුද හමුද පුරෝගාමි බලකායේ මේජර් ඩී. එම්. ඇතුලත්මුදලිට පසු ආසන්නතම ජ්‍යෙෂ්ඨත්වය ඇතිව 1962 ජූනි මස 12 වැනි දින සිට පහත නම් සඳහන් නිලධාරියාව ලංකා යුද හමුදා පුරෝගාමි බලකායට මාරු කරන ලදී :—

මේජර් ස්ටැන්ලි ලෙනාඩ් වැගොඩපොල, සි.රෙ.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

ඇන්. කජු. දියෙස්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
සථිර ලේකම්.

1962 ජූලි 2 වෙනිද,
කොළඹ දීය.

7-314

### විශෙෂ නිවේදනයයි

නිෂ්පාදන වියදම් අධිකවීමේ හේතුන් නිසා ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ දැන්වීම් පළකිරීමේ ගාස්තු වැඩි කිරීමට තීරණය කර ඇත. දැනට පවතින පළමුවන අඟලට රු. 10 ක් සහ වැඩිවන සෑම අඟලක් සඳහා රු. 5 බැගින් අයකරනු ලබන ගාස්තුව වෙනුවට, 1962 ජූලි මස 16 වෙනි දින සිට වෙළඳ ලකුණු දැන්වීම් හැර අන් සියළුම දැන්වීම් සඳහා තනි තීරුවේ සෑම අඟලකට හෝ ඉන් කොටසකට රු. 10 බැගින්ම අයකරනු ලබන බව සෑම දෙනාගේම දැනගැනීම සඳහා මෙයින් නිවේදනය කරමි.

බර්නාඩ් ද සිල්වා,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1962 ජූනි මස 29 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය,
කොළඹ.

අංකය : ඩී/වීඑෆ්ජ්/42.

**යුද්ධ හමුදාව—ලංකා ස්වේච්ඡා භට සේනාව—1962 ජූනි 15 වෙනි සිකුරාදා ප්‍රසිද්ධ කරන ලද අංක 13,168 දරණ ගැසට් පත්‍රයේ පළවුනු දැන්වීමට අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද සංශෝධනයක්**

**1962 අංක 230**

" 2 වැනි (ස්වේච්ඡා) සුළු ගගන නාශක රෙජිමේන්තුව, ලංකා කාල තුවක්කු හමුදාව " යටතේ 6 වැනි පේළියේ " කපිතාන් ජෝන් ඇන්තනි රාජරත්නම් " වෙනුවට, " කපිතාන් ජෝන් ඇන්තනි රාජරත්නම් පීලික්ස් " යන්න යොදන්න.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

ඇන්. කථු. දියෙස්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු
අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1962 ජූලි මස 2 වැනි දින,
කොළඹ දීය.

7-278

---

**1962 අංක 273**

අංකය : ඩී. 42/රෙක් ව්.

**නිලධාරීන් පත්කිරීම්—රාජකීය ලංකා නාවික හමුදාව**

අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් රාජකීය ලංකා නාවික හමුදාවේ පහත සඳහන් පත්කිරීම අනුමත කර තිබේ :—

1962 ජූනි මස 18 වැනි දින සිට රා. ව. ලං. නාරාවා නෞකාවේ අණදෙන නිලධාරි වශයෙන්—

වැඩ බලන උප ලුසිතන් ආර්. රාසයියා, රා. ලං. නා. හ.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

ඇන් කථු. දියෙස්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1962 ජූලි 4 වෙනිදා,
කොළඹ දිය.

7-446

---

# අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරන පත්කිරීම් ආදිය

**1962 අංක 274**

අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් පහත සඳහන් පත්කිරීම් කර ඇත්තේය :—

අංකය : ජේඒජ්. 29/48.

ඒ. මානික්කවාසගර් මහතා ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේක වශයෙන් 1962 ජූනි 28 වැනි දින සිට, මහනුවර දිස්ත්‍රික් උසාවියේ අංක 1476 දරණ බූදල් නඩුවේ තීන්දුව දීමට, මහනුවර, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑම්. 35/48.

සී. එල්. පී. මූනමලේ මහතා ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේක වශයෙන් 1962 ජූලි 2 වැනි දින සිට 19 වැනි දින දක්වා හෝ නැවත නියමයක් කරන තුරු, කතරගම පිහිටි උසාවියේ ක්‍රියා කරන පිණිස, බදුල්ල-හල්දුම්මුල්ල අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට.

අංකය : ජේඑම්. 35/48.

සී. එල්. පී. මූනමලේ මහතා වෙනත් රාජකාරිවල යෙදී සිටින අතර, හෝ නැවත නියමයක් කරන තුරු, කේ. වී. සුවර්නාධිපති මහතා 1962 ජූලි 2 වැනි දින සිට 19 වැනි දින දක්වා, හම්බන්තොට මහෙස්ත්‍රාත් ධුරයේ හා රික්වැස්ට් කොමසාරිස් ධුරයේ, තංගල්ලේ, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයේ හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයේ හා තංගල්ලේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයේ වැඩ බැලීමට.

අංකය : ජේඑල්. 55බී/61.

ඩී. ඩබ්ලිව්. කේ. ලද්දුවහෙට්ටි මහතා නැවත වැඩ බාරගන්නා තුරු, හෝ නැවත නියමයක් කරන තුරු, ජේ. එන්. සී. තිරුචෙල්වම් මහතා 1962 ජූනි 29 වැනි දින සිට හා 1962 ජූලි 3 වැනි දින සිට, කොළඹ, අතිරේක නාගරික මහෙස්ත්‍රාත් ධුරයට, හා කොළඹ, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට.

අංකය : ජේඒජ්. 16/48.

ජේ. එන්. සී. තිරුචෙල්වම් මහතා 1962 ජූනි 30 වැනි දින සිට, කොළඹ නාගරික මහෙස්ත්‍රාත් උසාවියේ අංක 81185 සහ 63640 දරණ නඩුවල තීන්දු දීමට, කොළඹ, අතිරේක නාගරික මහෙස්ත්‍රාත් ධුරයට, හා කොළඹ, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට.

අංකය : ජේඑල්. 40ඒ/60.

සී. එල්. පී. මූනමලේ මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු ජේ. අමරසිංහ මහතා 1962 ජූලි 21 වැනි දින සිට 23 වැනි දින දක්වා, හම්බන්තොට, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, තංගල්ලේ, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට හා තංගල්ලේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 17ඒ/51.

එන්. එදිරිසිංහ මහතා නැවත වැඩ බාරගන්නා තුරු හෝ නැවත නියමයක් කරන තුරු, ටී. පී. සී. කැරන් මහතා 1962 ජූලි 2 වැනි දින සිට, මීගමුවේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, මීගමුවේ, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට හා මීගමුවේ, අතිරේක නාගරික මහෙස්ත්‍රාත් ධුරයට.

අංකය : ජේඑල්. 7ඒ/56.

එල්. එච්. ද අල්විස් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එෆ්. වී. එච්. ලාබ්‍රොයි මහතා 1962 ජූලි 9 වැනි දින නුවරඑළියේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, නුවරඑළියේ, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, නුවරඑළියේ, අතිරේක නාගරික මහෙස්ත්‍රාත් ධුරයට හා බදුල්ල-හල්දුම්මුල්ල, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට.

අංකය : ජේඑල්. 42ඒ/53.

සී. පී. නිස්සංග මහතා නැවත වැඩ බාරගන්නා තුරු හෝ නැවත නියමයක් කරන තුරු, ජේ. ඩබ්ලිව්. වික්‍රමසිංහ මහතා 1962 ජූලි 2 වැනි දින සිට මාතර, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, මාතර, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට හා තංගල්ලේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 49ඒ/53.

එම්. පී. සී. රත්නම් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු. එෆ්. ඩබ්ලිව්. ගුණරත්න මහතා 1962 ජූලි 6 වැනි දින සිට 9 වැනි දින දක්වා, මීගමුවේ, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, මීගමුවේ, අතිරේක නාගරික මහෙස්ත්‍රාත් ධුරයට හා මීගමුවේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : පීඑල්/එස්. 6/48.

වී. සෝමසුන්දරම් මහතා නැති අතර, පී. වී. සෝනාතිරාජා මහතා 1962 ජූලි 4 වැනි දින වවුනියාවේ හා යාපන දිස්ත්‍රික්කවල, උතුරු වවුනියාවේ හා මුහුදුබඩ පත්තුවල ගම්බද උසාවි සභාපති ධුරයේ හා පූනාකාරි-තුන්නුකායි ගම්බද උසාවි අතිරේක සභාපති ධුරයේ වැඩ බැලීමට.

අංකය : පීඑල්/එස්. 13/61.

එම්. ජේ. පී. සිල්වා මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, වී. ඒ. ඩබ්ලිව්. වික්‍රමසූරිය මහතා 1962 ජූලි 7 වැනි හා 9 වැනි දිනයන්හි, තංගල්ල දිස්ත්‍රික්කයේ, බටගිර ගිරුවා පත්තුවේ ගම්බද උසාවි සභාපති ධුරයේ වැඩ බැලීමට.

අංකය : පීඑල්/ජී. 4/59.

ඩී. බී. ඇල්ලේපොල මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ජේ. ඒ. හසන්නාලි මහතා 1962 ජූලි 9 වැනි දින, බදුල්ල දිස්ත්‍රික්කයේ, වෙල්ලස්ස-බින්තැන්නේ ගම්බද උසාවි සභාපති ධුරයේ වැඩ බැලීමට, සහ යටිකිඳ ගම්බද උසාවි අතිරේක සභාපති ධුරයේ වැඩ බැලීමට,

ඇන්. ඒ. ද ඇස්. විජේසේකර,
අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1962 ජූලි 5 වැනි දින,
අධිකරණ සේවා කොමිෂන් සභා කාර්යාලය,
තැ. පෙ. අංක 573,
කොළඹ 12.

7-393

# වෙතත් පත්කිරීම් ආදිය

1962 අංක. 275

## ගැසට් නිවේදනයයි

අංක ඕඑම්/4/1/11/එෆ්ජ (II).

ලංකා විදේශ සේවයේ පහත සඳහන් මාරුකිරීම පහත දැනුම් දී ඇති දින සිට බල පැවැත් වේ:—

1962 ජූලි මස 1 වෙනි දින සිට නැවත නියම කරනතුරු ලංකා විදේශ සේවයේ සිව්වැනි ශ්‍රෙණියේ ඩබ්ලිව්. පී. එස්. ආර්. ජයවීර මහතා රාජ්‍ය ආරක්‍ෂක හා විදේශ කටයුතු භාර අමාත්‍යාංශයේ සහකාර ලේකම් වශයෙන්.

ඇන්. කෲ. දියෙස්,
රාජ්‍ය ආරක්‍ෂක හා විදේශ කටයුතු පිළිබඳ
අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1962 ජූනි මස 30 වැනි දින,
සෙනෙට් ගොඩනැගිල්ල,
කොළඹ 1.

7-267

1962 අංක 276

## ගැසට් නිවේදනයයි

අංක: ඕඑම්/4/1/11/එජ් 11.

ලංකා විදේශ සේවයේ පහත සඳහන් මාරුකිරීම පහත දැනුම් දී ඇති දින සිට බල පැවැත්වේ.

1962 ජූනි මස 21 වෙනි දින සිට නැවත නියම කරනතුරු ලංකා විදේශ සේවයේ සිව්වැනි පෙළේ ටී. ඒ. ක්‍රෙල්ෂම් මහතා රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු භාර අමාත්‍යාංශයේ සහකාර ලේකම් වශයෙන්.

ඇන් කෲ දියෙස්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

සෙනේට් ගොඩනැගිල්ල,
කොළඹ 1,
1962 ජූලි 3 දින.

7-299

1962 අංක. 277

## නිවේදනයයි

ලංකා සිවිල් සේවාවේ පහත සඳහන් පත්වීම් පහත දක්වා ඇති දිනවල පටන් වලංගු වේ:—

අංක 74/2/210 (ඇම් ඇෆ්ජ්).

ඒ. බී. සමරජීව මහතා 1962 මැයි මස 15 වැනි දින සිට ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවට අනුයුක්තව සිටීමට.

එම්. ඩී. ඩී. පීරිස් මහතා 1962 මැයි 14 වැනි දින සිට අග්‍රාමාත්‍ය කාර්යාලයට අනුයුක්තව සිටීමට.

හ. ඡ. අමරසිංහ,
භාණ්ඩාගාරයේ ලේකම්.

1962 ජූලි මස 3 වැනි දින,
මුදල් අමාත්‍යාංශය,
කොළඹ.

7-277

1962 අංක. 278

## ගැසට් නිවේදනයයි

(20 වෙනි පරිච්ඡේදය) ක්‍රිමිනල් නඩු විධාන සංග්‍රහයේ 120 වෙනි වගන්තිය යටතේ ගරු අධිකරණ ඇමතිතුමා විසින්—

අංකය: අයි. එන්. කෲ/එල්. 6/1/58.

1962, මැයි මස 31 වෙනි දින සිට එන්. පී. ද. ඉසැඩ්. ජයතිලක මහතා නැවත වැඩ භාරගන්නාතුරු, ගාලු දිස්ත්‍රික්කයේ, වැලිතර, ඌරගහ, කොස්ගොඩ හා අම්බලන්ගොඩ, බලපිටිය, කරන්දෙනිය යන විදාන ආරච්චි කොට්ඨාශවල හදිසි මරණ පරීක්ෂක ධූරයෙහි වැඩබැලීමට ඩී. ඒ. අස්සලආරච්චි මහතාද,

අංකය: අයි. එන්. කෲ/එල්. 11/1/57.

1962 ජූනි මස 7 වෙනි දින සිට ජේ. වී. පෙල්ඩානෝ මහතා නැවත වැඩ භාරගන්නාතුරු, මන්නාරම් දිස්ත්‍රික්කයේ තලෙයිමන්නාරම්—පේසාලෙයි කොට්ඨාශයේ හදිසි මරණ පරීක්ෂක ධූරයෙහි වැඩබැලීමට ඊ. බී. පෙල්ඩානෝ මහතාද,

අංකය: අයි. එන්. කෲ/එල්. 16/1/62.

1962 ජූනි මස 8 වෙනි දින සිට කේ. බී. ඉෂ්ටවීර මහතා නැවත වැඩ භාරගන්නාතුරු, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, කැඳු කෝරලයේ හදිසි මරණ පරීක්ෂක ධූරයෙහි වැඩ බැලීමට ජේ. ඇස්. රත්නායක මහතාද,

අංකය: අයි. එන්. කෲ/එල්. 14/4/60.

1962 ජූනි මස 14 වෙනි දින සිට කේ. බී. මේසසූරිය මහතා නැවත වැඩ භාරගන්නාතුරු, කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගන්නාවේ කෝරලයේ හදිසි මරණ පරීක්ෂක ධූරයෙහි වැඩබැලීමට වී. බී. අරඹේපොල මහතාද,

අංකය: අයි. එන්. කෲ/එල්. 11/1/60.

1962 ජූනි මස 15 වැනි දින සිට එස්. එස්. රාජදුරේ මහතා නැවත වැඩ භාරගන්නාතුරු, මන්නාරම් දිස්ත්‍රික්කයේ මන්තායි උතුරු ප්‍රදේශයේ හදිසි මරණ පරීක්ෂක ධූරයෙහි වැඩබැලීමට ඒ. ප්‍රනාන්දු මහතාද,

අංකය: ඒ. අයි. 3/9/57.

1962 අප්‍රේල් මස 17 වැනි දින සිට ස්ථිර පත්වීමක් කරනතුරු මහනුවර දිස්ත්‍රික්කයේ යටිනුවර මැදපලාත කෝරලේ හදිසි මරණ පරීක්ෂක ධූරයෙහි වැඩබැලීමට ආර්. බී. වීරසේකර මහතාද,

අංකය: ඒ. අයි. 17/3/51.

1962 ජූනි මස 18 වැනි දින සිට ස්ථිර පත්වීමක් කරනතුරු බදුල්ල දිස්ත්‍රික්කයේ, උඩපලාත කෝරලේ හදිසි මරණ පරීක්ෂක ධූරයෙහි වැඩබැලීමට වීරසේකර මුදියන්සේලාගේ පුංචිබණ්ඩා වීරසේකර මහතාද,

අංකය: අයි. එන්. කෲ/එල්. 6/1/57.

1962 ජූනි මස 24 වෙනි දින සිට, ඒ. සී. පී. ඩී. ද ඉසැඩ් ජයතිලක මහතා නැවත වැඩ භාරගන්නාතුරු, ගාලු දිස්ත්‍රික්කයේ බලපිටිය කරංදෙනිය බෙන්තර වලල්ලාවිටි කෝරලේ. වැලිතර, ඌරගහ, කොස්ගොඩ සහ අම්බලන්ගොඩ යන විදාන ආරච්චි කොට්ඨාශවල හදිසි මරණ පරීක්ෂක ධූරයෙහි වැඩබැලීමට ඩී. ඒ. අස්සලආරච්චි මහතාද,

අංකය: අයි.එන්. කෲ/එල්. 6/2/58.

1962 ජූනි මස 28 වෙනි දින සිට ඩී. ඒ. අස්සලආරච්චි මහතා නැවත වැඩ භාරගන්නාතුරු, ගාලු දිස්ත්‍රික්කයේ බෙන්තර වලල්ලාවිටි කෝරලේ, බෙන්තර, ඉඳුරුව සහ පහලගංහය යන විදාන ආරච්චි කොට්ඨාශවල හදිසි මරණ පරීක්ෂක ධූරයෙහි වැඩ බැලීමට එන්. පී. ද. ඉසැඩ් ජයතිලක මහතාද,

අංකය: අයි.එන්. කෲ/එල්. 11/8/57.

1962 ජූනි මස 20 වෙනි දින සිට, එස්. අරුලප්පු ඩයස් මහතා නැවත වැඩ භාරගන්නාතුරු, මන්නාරම් දිස්ත්‍රික්කයේ මරච්චකඩෙයි කොට්ඨාශයෙහි හදිසි මරණ පරීක්ෂක ධූරයෙහි වැඩබැලීමට ඒ. පරන වාස්. ඩයස් මහතාද,

අංකය: අයි.එන්. කෲ/එල්. 6/2/57.

1962 ජූනි මස 8 වෙනි දින සිට, ජේ. ඩබ්ලිව්. සිරිවර්ධන මහතා නැවත වැඩ භාරගන්නාතුරු, ගාලු දිස්ත්‍රික්කයේ බෙන්තර වලල්ලාවිටි කෝරලේ; වේරගොඩ, බටපොල සහ තොටගමුව යන විදාන ආරච්චි කොට්ඨාශවල හදිසි මරණ පරීක්ෂක ධූරයෙහි වැඩබැලීමට ජේ. පී. ගුරුසිංහ මහතාද,

අංකය: ඒ. අයි. 21/2/61.

1962 මැයි මස 2 වෙනි දින සිට, මොනරාගල දිස්ත්‍රික්කයේ, මොනරාගල ප්‍රාදේශිය ආදායම් නිලධාරි ධූරය දරණ කාලය තුල, එම කොට්ඨාශයේ හදිසි මරණ පරීක්ෂක වරයකු වශයෙන් එච්. ඒ. අබේගුණවර්ධන මහතාද,

අංකය: ඒ. අයි. 21/2/61.

1962 මැයි මස 2 වෙනි දින සිට, මොනරාගල දිස්ත්‍රික්කයේ, වැල්ලවායේ ප්‍රාදේශිය ආදායම් නිලධාරි ධූරය දරණ කාලය තුල, එම කොට්ඨාශයේ හදිසි මරණ පරීක්ෂක වරයකු වශයෙන් ඩබ්ලිව්. එම්. පී. බී. මැණික්දිවෙල මහතාද,

අංකය : අයි. එන්. කපු/එල්. 1/6/57.

1962 ජූනි මස 16 වෙනි දින සිට, වී. ටී. සී. රත්නායක මහතා නැවත වැඩ භාරගන්නාතුරු, කොළඹ දිස්ත්‍රික්කයේ මොරටුව ප්‍රදේශයේ හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩබැලීමට එම්. ඩබ්ලිව්. ප්‍රනාන්දු මහතාද,
පත් කර ඇත්තේ ය.

ඒ. එල්. එස්. සිරිමාන්න,
අධිකරණ අමාත්‍යාංශයේ වැඩබලන ස්ථිර ලේකම්.

1962 ජූලි මස 5 වෙනි දින,
කොළඹ අධිකරණ අමාත්‍යාංශයේ දීය.

7-500

---

1962 අංක 279

## ගැසට් නිවේදනයයි

මගේ අංකය : ඒ. ජේ. 2/3/59.

අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ ගරු අධිකරණ අමාත්‍යවරයා කෙරෙහි පවරා ඇති බලතල අනුව එතුමා විසින්—

(1) එච්. එස්. වීරසේකර මහතා ගම්පහ අධිකරණ දිස්ත්‍රික්කය වෙනුවෙන් සමාදාන විනිශ්චයකරුවකු වශයෙන් ද,

(2) පී. කදිරවේලු පිල්ලෙයි මහතා කොළඹ අධිකරණ දිස්ත්‍රික්කය වෙනුවෙන් සමාදාන විනිශ්චයකරුවකු වශයෙන් ද,

(3) ඒ. ද එස්. තුඩුවෙවත්ත මහතා තංගල්ල අධිකරණ දිස්ත්‍රික්කය වෙනුවෙන් සමාදාන විනිශ්චයකරුවකු වශයෙන්ද,

(4) කේ. ඩබ්ලිව්. සිල්වා මහතා පානදුර අධිකරණ දිස්ත්‍රික්කය වෙනුවෙන් සමාදාන විනිශ්චයකරුවකු වශයෙන් ද

පත් කර ඇත්තේ ය.

ඒ. එල්. එස්. සිරිමාන්න,
අධිකරණ අමාත්‍යාංශයේ වැඩබලන
ස්ථිර ලේකම්.

1962, ජූලි මස 9 වෙනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේ දීය.

7-499

---

1962 අංක 280

115 වැනි පරිච්ඡේදයේ මුස්ලිම් විවාහ හා දික්කසාද ආඥාපණතේ 13 වැනි වගන්තිය යටතේ කර්මාන්ත, ස්වදේශ හා සංස්කෘතික කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා විසින් කොළඹ දිස්ත්‍රික්කයේ කොළඹ අධිකරණ කොට්ඨාශයට අයත් කොළඹ නගර සභා කොට්ඨාශයක් වූ කොම්පඤ්ඤ වීදිය, හුණුපිටිය, වැකන්ද, කුරුඳුවත්ත, කොල්ලුපිටිය, බම්බලපිටිය, හැව්ලොක් ටවුම, තිඹිරිගස්යාය, වැල්ලවත්ත උතුරු සහ වැල්ලවත්ත දකුණ, කෝට්ටෙ පාරේ පිහිටි ස්වදේශීය වෛද්‍ය විද්‍යාලයට ආසන්න ස්ථානයක සිට බත්තරමුල්ල, තලන්ගම උතුර, මාලබේ, හෝකන්දර, අතුරුගිරිය, පනාගොඩ, ගොඩගම සහ මීගොඩ යන ගම් පසුකොට පාදුක්ක දක්වා විහිදී ඇති ප්‍රසිද්ධ පාර දකුණෙන් පිහිටි ප්‍රදේශ ඇතුළත් අධිකරණ කොට්ඨාශයේ ක්වාසි ධුරයට කොළඹ බම්බලපිටියේ, මැල්බෝන් මාවතේ අංක 6 දරණ ස්ථානයේ පදිංචි මොහමඩ් ඉබ්‍රාහිම් හාජියාර් මොහමඩ් සාලි මහතා පත් කරන්ට යෙදුනා ඇත.

කර්මාන්ත, ස්වදේශ හා සංස්කෘතික
කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1962 ජූනි මස 20 වැනි දින,
කොළඹ දී ය.

7-311

---

1962 අංක 281

## දැන්වීමයි

කුස්තුරිආරච්චිගේ වික්ටර් ඇල්බට් පෙරේරා මහතා කොළඹ අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රිසි භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් කර්මාන්ත, ස්වදේශ සහ සංස්කෘතික කටයුතු පිළිබඳ ගරු අමාත්‍යතුමා විසින් පත් කර තිබේ.

කර්මාන්ත, ස්වදේශ සහ සංස්කෘතික
කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1962 ජූනි මස 27 වැනි දින,
කොළඹ දීය.

7-298

---

# ආණ්ඩුවේ නිවේදන

## කෘෂිකාර්මික හා කර්මාන්ත සඳහා ණය දෙන සංස්ථාවේ අධ්‍යක්ෂක මණ්ඩලය

අංකය : 48/4 (ඒ සී)

ගරු මුදල් ඇමතිතුමා විසින් කෘෂිකාර්මික හා කර්මාන්ත සඳහා ණය දෙන සංස්ථාවේ 7 වැනි අධ්‍යක්ෂක මණ්ඩලයට 1962 ජූනි මස 30 වැනි දින සිට තුන් වසක කාලයක් සඳහා පහත සඳහන් අය පත් කරන්නට යෙදී ඇත.

ඒ. අයි. එච්. ඒ. වහාබ් මහතා.

හ. පණ්ඩිත ගුණවර්ධන,
මුදල් අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්
වෙනුවට.

මුදල් අමාත්‍යාංශය,
1962 ජූලි මස 5 වැනි දින,
කොළඹ දී ය.

7-335

---

## දැන්වීමයි

ගම්පහ අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රිසි භාෂාවෙන් නොතාරිස් ධුරයේ කටයුතු කිරීමට බලය ලත් මාදම්පාහෙට්ටි ආරච්චිගේ වික්‍රමරත්න තිසේරා මහතාට එම අධිකරණ කොට්ඨාශය ඇතුළත සිංහල භාෂාවෙන් නොතාරිස් කෙනෙකු වශයෙන් කටයුතු කිරීමට ද කර්මාන්ත, ස්වදේශ සහ සංස්කෘතික කටයුතු පිළිබඳ ගරු අමාත්‍ය තුමා විසින් අවසර දී තිබේ.

කර්මාන්ත, ස්වදේශ සහ සංස්කෘතික
කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1962 ජූනි මස 27 වැනි දින,
කොළඹ දීය.

7-297

---

## දැන්වීමයි

ගාල්ල අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රීසි භාෂාවෙන් නොතාරිස් ධුරයේ කටයුතු කිරීමට බලය ලත් ඇන්තනි ජෝශප් පාර්සිවල් මේරියන් ජයවර්ධන මහතාට එම අධිකරණ කොට්ඨාශය ඇතුළත සිංහල භාෂාවෙන් නොතාරිස් කෙනෙකු වශයෙන් කටයුතු කිරීමට ද කර්මාන්ත, ස්වදේශ සහ සංස්කෘතික කටයුතු පිළිබඳ ගරු අමාත්‍ය තුමා විසින් අවසර දී තිබේ.

කර්මාන්ත, ස්වදේශ සහ සංස්කෘතික
කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1962 ජූනි මස 27 වැනි දින,
කොළඹ දීය.

7-296

---

## පඩි පාලක සභා ආඥාපනත

### සේව්‍යයන්ට කරන නිවේදනයයි

පඩි පාලක සභා පිහිටුවා ඇති පහත සඳහන් කර්මාන්ත වල කම්කරුවන් සේවයේ යොදවා සිටින සෑම සේව්‍යයකු වෙත දැනට එවා ඇති පෝරමයෙහි අසා ඇති තොරතුරු 1962 අගෝස්තු 1 වන දින හෝ ඊට පෙර මා වෙත එවන මෙන් කම්කරු කොමසාරිස් නෙවිල් ලින්කන් අබේවීර වන මා පඩි පාලක ආඥා පනතේ (130 වැනි අධිකාරය) 54 වැනි වගන්තියෙන් ලැබී ඇති බලය පිට එකී සේව්‍යයන්ට මෙයින් දැනුම් දෙනු ලැබේ.

2. මේ විස්තර නොසපයන කවර සේව්‍යයෙක් වුවද පඩි පාලක සභා ආඥා පනත යටතේ දඬුවම් ගෙන දෙන වරදකට වරදකරුවෙක් වන්නේ ය.

3. මේ නිවේදනය යටතේ සැපයිය යුතු සියලුම වාර්තාද ඒ පිළිබඳ ලියන සියලුම ලියකියවිලිද, කම්කරු කොමසාරිස් " ඇස් " ශාඛාව කොළඹ. යනුවෙන් පිටනම ලියා එවිය යුතුයි. තම කර්මාන්තයට ගැළපෙන ආකෘති පත්‍රය නොලැබුණේ නම් ඒ බව සෑම සේව්‍යයකු විසින්ම තමන් සම්බන්ධිත කර්මාන්තය ද දක්වමින් මේ ලිපිනයට දැනුම් දිය යුතුයි.

එන්. එල්. අබේවීර,
කම්කරු කොමසාරිස්.

1962 ජූලි මස 9 වැනි දින,
කොළඹ, කම්කරු දෙපාර්තමේන්තුවේදී ය.

## ඉහත සඳහන් කළ කර්මාන්ත

1. තේ වැවීම සහ සෑදීම.
2. කොකෝවා, කර්දමුංගු සහ ගම්මිරිස් වැවීම සහ සෑදීම.
3. රබර් වැවීම සහ සෑදීම.
4. පොල් වැවීම.
5. පොල් සෑදීම.
6. ඉංජිනේරු.
7. මුද්‍රණ.
8. මිනිරන්.
9. තේ පිටරට යැවීම.
10. රබර් පිටරට යැවීම.
11. රා අරක්කු සහ විනාකිරි.
12. සුරුට්ටු සෑදීම.
13. මෝටර් රථ ගමණාගමනය.
14. ගිණිකූරු සෑදීම.
15. චිත්‍ර පටි.
16. නෞකාගාර, නැව්තොට හා වරාය ගමනාගමනය.
17. ගොඩනැගිලි.
18. බීඩි සෑදීම.
19. බේකරි.
20. උළු සහ ගඩොල් සෑදීම.
21. කුරුඳු
22. කොහු ගුදිරි සහ දළ කොහු කෙඳි පිටරට යැවීම.
23. අයිස් සහ සිසිල් බීම සෑදීම.
24. නූල් කැටීම, රෙදි විවීම, සහ (මේස් බැනියම් ආදී භාණ්ඩ ඇතුළු) ඇඳුම් සෑදීම.

7-479

---

## (219 වෙනි අධිකාරය වන) සෞඛ්‍ය සේවා පනත

### ගාල්ලේ ආරෝග්‍යශාලා මණ්ඩලය

(219 වෙනි අධිකාරය වන) සෞඛ්‍ය සේවා පනතේ 11 වෙනි වගන්තිය යටතේ 1962 ජූනි මස 27 වෙනි දින පටන් 1962 දෙසැම්බර් මස 31 වෙනි දින දක්වා එච්. ශු. ද සිල්වා මහතා ගාල්ලේ ආරෝග්‍යශාලා මණ්ඩලයේ සාමාජිකයෙකු වශයෙන් ගරු සෞඛ්‍ය ඇමතිතුමා විසින් පත් කරනු ලැබූහ.

එල්. එස්. බී. පෙරේරා,
සථිර ලේකම්.

1962 ජූනි මස 27 වෙනි දින,
කොළඹ, සෞඛ්‍ය අමාත්‍යංශයේ දීය.

7-255

---

## (219 වෙනි අධිකාරය වන) සෞඛ්‍ය සේවා පනත

### උතුරු කොළඹ ආරෝග්‍යශාලා මණ්ඩලය

(219 වෙනි අධිකාරය වන) සෞඛ්‍ය සේවා පනතේ 11 වෙනි වගන්තිය යටතේ 1962 ජූලි මස 3 වෙනි දින පටන් 1962 දෙසැම්බර් මස 31 වෙනි දින දක්වා ආයුර්වේද වෛද්‍යාචාර්ය ඒ. ඩී. ජේ. එල්. ලියෝ මහතා උතුරු කොළඹ ආරෝග්‍යශාලා මණ්ඩලයේ සාමාජිකයෙකු වශයෙන් ගරු සෞඛ්‍ය ඇමතිතුමා විසින් පත් කරනු ලැබූහ.

එල්. එස්. බී. පෙරේරා,
සථිර ලේකම්.

1962 ජූලි මස 3 වෙනි දින,
කොළඹ, සෞඛ්‍ය අමාත්‍යංශයේ දීය.

7-425

---

## (106 වෙනි අධිකාරය වන) සවදේශීය වෛද්‍ය ආඥාපනත

(106 වෙනි අධිකාරය වන) සවදේශීය වෛද්‍ය ආඥාපනතෙහි 3 (4) වෙනි වගන්තිය යටතේ සවදේශීය වෛද්‍යෝපදේශක සභාවේ පහත සඳහන් සාමාජිකවරුන් 1962 ජූලි මස 15 වෙනි දින සිට නැවත වරක් තෙවසක කාලයකට සවදේශීය වෛද්‍යෝපදේශක සභාවේ සාමාජිකයන් මෙන් ගරු සෞඛ්‍ය ඇමතිතුමා විසින් පත් කරනු ලැබීය.

එල්. එස්. බී. පෙරේරා,
සථිර ලේකම්.

1962 ජූලි මස 6 වෙනි දින,
කොළඹ, සෞඛ්‍ය අමාත්‍යංශයේ දීය.

### නාම ලේඛනය

1. ඩබ්ලිව්. ජේ. ප්‍රනාන්දු මහතා (සභාපති)
2. පූජ්‍ය මහාචාර්ය කේ. පඤ්ඤාකිත්ති සවාමීන් වහන්සේ
3. කේ. කනගරත්නම් මහතා
4. මුහන්දිරම් ඒ. විලියම් විජේරත්න මහතා
5. වෛද්‍යාචාර්ය ආර්. බුද්ධදාස මහතා
6. වෛද්‍යාචාර්ය ටී. සාදිරිස් ප්‍රනාන්දු මහතා
7. වෛද්‍යාචාර්ය එස්. පී. ඩබ්ලිව්. සිරිවර්ධන මහතා
8. වෛද්‍යාචාර්ය එම්. ඩබ්ලිව්. එන්. එස්. විජේසිරි මහතා
9. වෛද්‍යාචාර්ය පණ්ඩිත ආර්යදාස කුමාරසිංහ මහතා

7-502

---

## 1954 අංක 37 දරණ ජාතික නිවාස පනත

### 49 ඡේදය යටතේ සහතිකය

පළාත් පාලන හා නිවාස පිළිබඳ ඇමතිවර, මහානාම සමරවීර වන මම 1954 අංක 37 දරණ ජාතික නිවාස පනතේ 49 වන ඡේදය යටතේ මා වෙත පවරා ඇති බලතල උඩ මෙහි පහත සඳහන් උපලේඛනයෙහි විස්තර කර ඇති ඉඩම එම පනතෙහි 2 වන ඡේදයෙහි අදහසට ඇතුළත් නිවාස අරමුණක් ක්‍රියාත්මක කිරීම සඳහා රජය මගින් අත්කර ගත යුතු බව මෙයින් සහතික කරමි.

මහානාම සමරවීර,
පළාත් පාලන හා නිවාස ඇමති තුමා.

1962 ජූනි මස 25 වැනි දින,
කොළඹ 2 දීය.

### උපලේඛනය I

දකුණු පළාතේ ගාල්ල දිස්ත්‍රික්කයේ වැල්ලබඩ පත්තුව ආදායම් පාලක නිලධාරි කොට්ඨාශයේ අංක 86 දරණ පොල්වත්ත ගම්මුලාදෑනි වසමේ පිහිටි තල්ගස්ගොඩවත්ත නමැති ඉඩමෙන් පහත සඳහන් පරිදි මායිම් ඇති අක්කර 3ක පමණ ප්‍රමාණයක ඉඩම් කොටසක් :—

උතුරට : ඇම්. කුරුමානිස් සිල්වාගේ උරුමක්කාරයින්ට අයිති දැව්වවත්ත ; නැගෙනහිරට : ගාල්ලේ රාජගුරු ප්‍රසාදීන් වහන්සේට අයිති ස්වාමිගේ ඉඩම ; දකුණට : පොල්වත්ත-බවේපොල ප්‍රසිද්ධ පාර ; බස්නාහිරට : තල්ගස්ගොඩ බැද්ද.

### උපලේඛනය II

දකුණු පළාතේ ගාල්ල දිස්ත්‍රික්කයේ වැල්ලබඩ පත්තුව ආදායම් පාලක නිලධාරි කොට්ඨාශයේ අංක 86 දරණ පොල්වත්ත ගම්මුලාදෑනි වසමේ පිහිටි තල්ගස්ගොඩවත්ත නමැති ඉඩමෙන් පහත සඳහන් පරිදි මායිම් ඇති පර්චස් 20ක පමණ ප්‍රමාණයක ඉඩම් කොටසක් :—

උතුරට : පොල්වත්ත-බවේපොල ප්‍රසිද්ධ පාර ; නැගෙනහිරට : ගාල්ලේ රාජගුරු ප්‍රසාදීන් වහන්සේට අයිති ස්වාමිගේ ඉඩම ; දකුණට : අක්කර හැත්තෑව නමැති ඉඩම ; බස්නාහිරට : තල් ගස්ගොඩ බැද්ද.

7-301

---

## 1954 අංක 37 දරණ ජාතික නිවාස පනත

### 49 ඡේදය යටතේ සහතිකය

පළාත් පාලන හා නිවාස පිළිබඳ ඇමතිවර, මහනාම සමරවීර වන මම, 1954 අංක 37 දරණ ජාතික නිවාස පනතේ 49 වන ඡේදය යටතේ මා වෙත පවරා ඇති බලතල උඩ මෙහි පහත සඳහන් උපලේඛනයෙහි විස්තර කර ඇති ඉඩම එම පනතෙහි 2 වන ඡේදයෙහි අදහසට ඇතුළත් නිවාස අරමුණක් ක්‍රියාත්මක කිරීම සඳහා රජය මගින් අත්කර ගත යුතු බව මෙයින් සහතික කරමි.

මහානාම සමරවීර,
පළාත් පාලන හා නිවාස ඇමති තුමා.

1962 ජූනි මස 28 වැනි දින,
කොළඹ 2 දීය.

### උපලේඛනය

වයඹ පළාතේ හලාවත දිස්ත්‍රික්කයේ දකුණු පිටිගල් කෝරලය ආදායම් පාලක නිලධාරි කොට්ඨාශයේ අංක 512 දරණ මාරවිල ගම් මුලාදෑනි වසමේ පිහිටි මයිලගහවත්ත නමැති ඉඩමෙන් පහත සඳහන් පරිදි මායිම් ඇති අක්කර 4ක පමණ ප්‍රමාණයක ඉඩම් කොටසක් :—

උතුරට : ජී. පෙසෝනා හාමිට අයිති ඉඩම ; නැගෙනහිරට : වීදිය පාර ; දකුණට : පුද්ගලික ඉඩම ; බස්නාහිරට : මීගමු-හලාවත ප්‍රසිද්ධ පාර.

7-302



ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානය

## 1954 අංක 37 දරණ ජාතික නිවාස පනත

### 49 ඡේදය යටතේ සහතිකය

පළාත් පාලන හා නිවාස පිළිබඳ ඇමතිවර, මහානාම සමරවීර වන මම, 1954 අංක 37 දරණ ජාතික නිවාස පනතේ 49 වන ඡේදය යටතේ මා වෙත පවරා ඇති බලතල උඩ මෙහි පහත සඳහන් උපලෙඛනයෙහි විස්තර කර ඇති ඉඩම එම පනතෙහි 2 වන ඡේදයෙහි අදහසට ඇතුළත් නිවාස අරමුණක් ක්‍රියාත්මක කිරීම සඳහා රජය මගින් අත්කර ගත යුතු බව මෙයින් සහතික කරමි.

මහානාම සමරවීර,
පළාත් පාලන හා නිවාස ඇමති තුමා.

1962 ජූනි මස 25 වැනි දින,
කොළඹ 2 දීය.

### උපලෙඛනය

දකුණු පළාතේ මාතර දිස්ත්‍රික්කයේ වැල්ලබඩ පත්තු සහ කඩවත් සතර ආදායම් පාලක නිලධාරි කොට්ඨාශයේ ගන්දරාගොඩ ගම්මුලාදෑනි වසමේ පිහිටි වටදෙකෙවත්ත නමැති ඉඩමෙන් පහත සඳහන් පරිදි මායිම් ඇති අක්කර දෙකක පමණ ප්‍රමාණයක ඉඩම් කොටසක් :—

උතුරට : පුද්ගලික ඉඩම් ; නැගෙනහිරට : අඩි පාර ; දකුණට : ඕඩේවත්ත ; බස්නාහිරට : පුද්ගලික ඉඩම්.

7-303

## 1954 අංක 37 දරන ජාතික නිවාස පනත

### 49 ඡේදය යටතේ සහතිකය

පළාත් පාලන හා නිවාස පිළිබඳ ඇමතිවර, මහානාම සමරවීර වන මම, 1954 අංක 37 දරණ ජාතික නිවාස පනතේ 49 වන ඡේදය යටතේ මා වෙත පවරා ඇති බලතල උඩ මෙහි පහත සඳහන් උපලෙඛනයෙහි විස්තර කර ඇති ඉඩම එම පනතෙහි 2 වන ඡේදයෙහි අදහසට ඇතුළත් නිවාස අරමුණක් ක්‍රියාත්මක කිරීම සඳහා රජය මගින් අත්කර ගත යුතු බව මෙයින් සහතික කරමි.

මහානාම සමරවීර,
පාළත් පාලන හා නිවාස ඇමති තුමා.

1962 ජූනි මස 26 වැනි දින,
කොළඹ 2 දීය.

### උපලෙඛනය

මධ්‍යම පළාතේ නුවරඑළිය දිස්ත්‍රික්කයේ කොත්මලේ ආදායම් පාලක නිලධාරි කොට්ඨාශයේ මල්ලන්ද ගම්මුලාදෑනි වසමේ පිහිටි බොන්සයිඩ් වත්තෙන් පහත සඳහන් පරිදි මායිම් ඇති අඩි 50ක් දිග සහ අඩි 50ක් පළලැති පර්චස් 9ක පමණ විශාලත්වයක් ඇති ඉඩම් කොටසක් :—

උතුරට : එම ඉඩමේ ඉතිරි කොටස ; නැගෙනහිරට : එම ඉඩමේ ඉතිරි කොටස ; දකුණට : එම ඉඩමේ ඇති ඇල ; බස්නාහිරට : ගම්සභා පාර.

7-304

---

## 1950 අංක 29 දරණ මිළ පාලන පනත

පහත පෙනෙන උපලේඛනයේ සඳහන් නියෝග මවිසින් අනුමත කරනු ලැබූ බව 1950 අංක 29 දරණ මිළ පාලන පනතේ 4 වෙනි වගන්තියේ 7 වෙනි අතුරු වගන්තිය යටතේ මවිසින් මෙයින් දනුම් දෙමි.

ටී. බී. ඉලංගරත්න,
වාණිජ, වෙළඳ, ආහාර හා නැව් කටයුතු පිළිබඳ ඇමති.

1962 ජූනි 30 දින,
කොළඹ 2.

### උපලේඛනය

| දිනය | නියෝගය | නියෝගය නිකුත් කරන ලද ද්‍රව්‍ය | නියෝගය පළ කරන ලද ගැසට් පත්‍රය |
|---|---|---|---|
| 62. 5. 2 | මිළ (ආහාර) පාලක | අතිරේක ආහාර ද්‍රව්‍ය | 62. 5. 2 වෙනි දින අංක 13,059 |
| 62. 5. 7 | එම | කරවල සහ වියළි ඉස්සෝ | 62. 5. 7 වෙනි දින අංක 13,078 |
| 62. 5.11 | එම | උම්බලකඩ සහ බොනිටෝපිෂ් | 62. 5.11 වෙනි දින අංක 13,104 |

7–436

---

## 1957තේ 48 වෙනි අංකය දරණ මෝටර් ගමනාගමන පණත

### 19 (2) වෙනි වගන්තිය යටතේ කරන දන්වීමයි

මේ සමඟ ඇති උපලේඛනයේ 1 වෙනි තීරයෙහි දක්වා ඇත්තා වූ ද එම උපලේඛනයේ 2 වෙනි තීරයෙහි අනුකූල සටහනෙහි දක්වා ඇති ස්ථානයෙහි පිහිටියා වූ ද එම උපලේඛනයේ 3 වෙනි තීරයේ අනුකූල සටහනෙහි දක්වා ඇති ගැසට් පත්‍රයෙහි, 1961තේ 22 වෙනි අංකය දරණ මෝටර් රථ ගමනාගමන (සංශෝධන) පනතින් සංශෝධිත, 1957තේ 48 වෙනි අංකය දරණ මෝටර් ගමනාගමන පනතේ 19 වෙනි වගන්තියේ (1) වෙනි උප වගන්තිය යටතේ පළකළ දන්වීමෙන් ලංකා ගමනාගමන මණ්ඩලයේ කටයුතු සඳහා උවමනා යයි ප්‍රකාශ කරනු ලැබුවා වූද දේපළ තත් මණ්ඩලයේ කටයුතු සඳහා දන් උවමනා නොවන බව කම්කරුවන් හා ජනසතු සේවාවන් පිළිබඳ ඇමතිතුමා විසින් ඒ පනතේ 19 වෙනි වගන්තියේ (2) වෙනි උප වගන්තිය යටතේ බලය පවරනු ලැබූ නිලධාරියෙක් වන තාමෝදරම් පුල්ලේ කාතිගේසර් වන මම, තත් වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල පිට මෙයින් ප්‍රකාශ කරමි.

වී. කාතිගේසර්,
ලංකා ගමනාගමන මණ්ඩලයේ
නියෝජ්‍ය ලේකම් තැන.

1962 ක්වූ ජූලි මස 6 දින කොළඹ දීය.

### උපලේඛනය

| | දේපළ | පිහිටීම හා සෙසු විස්තර | |
|---|---|---|---|
| | 1 වෙනි තීරය | 2 වෙනි තීරය | 3 වෙනි තීරය |
| 1. | සීමා සහිත යුනයිටඩ් බස් රථ සමාගම විසින් පාවිච්චි කරන ලද දේපල—පර්චස් 20ක් පමණ වර්ග ප්‍රමාණය ඇති (නමක් නැති) ඉඩම හා එහි වූ සියලු ගොඩනැගිලි | මහනුවර නාගරික සීමාවන් ඇතුළත මහනුවර කටුගස්තොට පාරේ උතුරට මහයා අල්ලද, නැගෙනහිරට කේ. ඩබ්ලිව්. ඩේවිඩ්ට හා අල්පා රේඩියො සේවාවට අයිති ඉඩමද දකුණට මහ පාරද බස්නාහිරට චන්ද්‍රා වූවර් සමාගමට අයිති ඉඩම ද යන මේ මායිම් තුල පිහිටි 136 වෙනි වරිපනම් අංකය දරණ ස්ථානය. | 1957 දෙසැම්බර් 27 වැනි දින හා අංක 11,224 දරණ ගැසට් පත්‍රය |
| 2. | සීමා සහිත (1952) සවුත් වෙස්ටර්න් ඔම්නි බස් රථ සමාගම විසින් පාවිච්චි කරන ලද දේපළ—මීගහලියැද්ද නම් මුඩු ඉඩමෙන් වර්ග ප්‍රමාණයෙන් පර්ච් 10ක් පමණ වූ කොටස | ගාලු දිස්ත්‍රික්කයේ බද්දෙගම නම් ගමේ උතුරට ගිං ගඟ ද නැගෙනහිරට ඉහළ පොල්වත්තය, මැදිලියැද්ද ය, මීගහඔවිට ය යන ඉඩම් ද දකුණට මීගහඔවිට නම් ඉඩම හා මහපාර ද බස්නාහිරට මහපාර හා ගිං ගඟ ද යන මේ මායිම් තුළ පිහිටා තිබේ. | 1957 දෙසැම්බර් 17 වෙනි දින හා අංක 11,220 දරණ ගැසට් පත්‍රය |

7–388

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## ප්‍රකාශනය

දකුණු පළාතේ ගාල්ල දිස්ත්‍රික්කයේ බෙන්තොට වල්ලාවිට කරවන ආදායම් පාලක නිලධාරි කොට්ඨාශයේ ගම් කීපයක ඇතිවූ රක්තාශ්‍රව (හෙමරජික් සෙප්ටිසීමියා) නමැති වසංගතය සම්බන්ධයෙන් 1962.6.9 දිනැතිව 1962.6.15 දින අංක 13,168 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය මගින් ප්‍රසිද්ධ කරන ලද ප්‍රකාශනයේ පළමු වැනි ඡේදයේ රෝග බලපවත්වන ගම් වශයෙන් පෙන්වා ඇති "ගොඩගේන, කටුවිල සහ නාපේ" යන්න වෙනුවට "ගොඩගම, කටුවිල සහ නාපේ" යන්නද,

ප්‍රකාශිත ප්‍රදේශයේ උතුරු මායිම් වශයෙන් පෙන්වා ඇති "යට ගම-මිරිස්වත්ත පාර ගෝනාගල හරහා" වෙනුවන "යාලේගම-මිරිස්වත්ත පාර ගෝනාගල හරහා" යන්නද යෙදී සංශෝධනය විය යුතු බව මහජනයාට මෙයින් දනුම් දෙමි.

ආරියදස අමරසිංහ,
රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරී.

1962 ජූලි 7 දින,
පේරාදෙණියේ
රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරි තැනගේ කාර්‍යාලයේදීය.

7-407

## ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුව

**උතුරු මධ්‍යම කොට්ඨාශය** — **අනුරාධපුර දිස්ත්‍රික්කය**

අනුරාධපුර දුම්රිය ස්ථානයට පිවිසෙන මාගීයේ අංක 3/1 දරණ පාලම නැවත තට්ටු දැමීම පිණිස 1962 ජූලි මස 15 වන දින පටන් මාස 1 1/2 කට සියලු රථ වාහනවලට වසා තබන බව මහජනයාගේ දැන ගැනීම පිණිස මෙයින් නිවේදනය කරමි.

මෙම මාගී කොටස වෙනුවට බේලි පාලම පසුකර පුත්තලම-ත්‍රිකුණාමලය මාගීය හරහා යා හැක.

මෙල්සන් ප්‍රනාන්දු,
ආණ්ඩුවේ වැඩ අධ්‍යක්ෂ වෙනුවට.

7-410

## ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුව

**උතුරු මධ්‍යම කොට්ඨාශය** — **නාලන්ද දිස්ත්‍රික්කය**

පල්ලේපොල-වහකෝට්ටේ මාර්ගයේ අංක 1/9 දරණ පාලම නැවත තට්ටු දැමීම සඳහා එම මාර්ගයේ පල්ලේපොල හංදියේ සිට 3 වන සැතපුම් කනුව දක්වා මාර්ගය සියලු රථ වාහන වලට 1962.7.15 දින සිට මාසයකට වසනු ලැබේ.

මෙම මාර්ග කොටස වෙනුවට රථ වාහන වලට පලාපත්වල-ගලේවෙල මාර්ගයේ තල්වත්ත හංදියෙන් හැරී මාදිපොල හරහා මිල්ලවානට යා හැක.

මෙල්සන් ප්‍රනාන්දු,
ආණ්ඩුවේ වැඩ අධ්‍යක්ෂ වෙනුවට.

7-505

**සෑම සිකුරාදා දිනයකම ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.**

**ගැසට් පත්‍රය පළ කරන දින සිට කාර්යාලය වැඩ කරන දින හතරකට ප්‍රථම පස්වරු 3.30 ට සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි (සාමාන්‍ය වශයෙන් සඳුදා පස්වරු 3.30 ට ප්‍රථමයෙන්).**

**ගැසට් පත්‍රය ලබාගැනීම සඳහා දයකමුදල් කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙලින්ම යැවිය යුතුය. ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දයකමුදල් භාරගනු නොලැබේ.**

ලංකාවේ වාලච්චේනයෙහි පිහිටි "ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන්" හි නිපදවන ලද කඩදාසිවල
ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රාපිතයි